# නාමයෝජනා හා රැස්වීම කැඳවීමේ නිවේදනය

සීමාසහිත සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතියේ 61 වන සංවත්සර මහ සභාව හා නිලවරණය **2026.03.28 වන දින පෙ.ව.9.00 ට මහනුවර, පොල්ගොල්ල, ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ මහින්ද රාජපක්ෂ ශ්‍රවණාගාරය ඇතුළු වම පරිශ්‍රයේදී පැවැත්වේ.** සභාවේ පුද්ගල යෝජනා වෙතොත් **2026.03.04 වන දින දහවල් 12.00 ට පෙර** මා වෙත ලැබීමට කටයුතු කල යුතු වේ.

එමෙන්ම සමිතියේ 2026.03.29 දින සිට ඉදිරි තුන් වර්ෂයක (03) කාලය සඳහා කාරක සභාවට (අධ්‍යක්ෂ මණ්ඩලයට) සභාපති, උපසභාපති, භාණ්ඩාගාරික සහ කාරක සභික (අධ්‍යක්ෂ මණ්ඩල) සාමාජිකයන් විසිදෙදෙනෙකු (22) ඇතුළුව සාමාජිකයන් විසිපස් දෙනෙකු (25) තෝරාපත් කර ගැනීම සඳහා නාමයෝජනා භාරගැනීම සහ විරෝධතා භාරගැනීම පහත පරිදි සිදු කරන බව සමිතියේ සාමාජිකත්වය වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

**නාමයෝජනා භාරගන්නා දිනය**

2026.03.05 වන දින පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා

**විරෝධතා භාරගැනීම**

2026.03.06 වන දින පෙ.ව. 9.00 සිට පෙ.ව. 10.00 දක්වා

**නාමයෝජනා සහ විරෝධතා භාර ගන්නා ස්ථානය**

**සීමාසහිත සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතිය. 37/36, පන්සල පාර, කොළඹ 10. (සිවවන මහලේ රැස්වීම් ශාලාවේදී)**

- නාමයෝජනා පත්‍ර කට්ටල අපේක්ෂක, යෝජනාකරු හෝ ස්ථිරකරු යන අයවලුන් විසින් හෝ ඉන් එක් අයෙකු විසින් පමණක් නියමිත දින, නාමයෝජනා භාරගැනීම අවසන් කිරීමේ වේලාවට පෙර සමිතියේ ලේකම් වෙත භාරදිය යුතුය.
- පිළිගත් අපේක්ෂකයන්ගේ නාමලේඛනය සමිති කාර්යාලයේදී 2026.03.06 වන දින පෙ.ව.11.00 සිට දහවල් 12.00 දක්වා ප්‍රදර්ශනය කෙරේ. (සිවවන මහලේ රැස්වීම් ශාලාව ඉදිරිපිටදී )
- මේ සමග දක්වා ඇති ආදර්ශයට අනුව සකසා ගත් නාමයෝජනා පත්‍රයක් මගින් (කට්ටල දෙකකින් යුතුව) තම නාමයෝජනාව ඉදිරිපත් කල යුතුය.
- මෙම ආදර්ශයට වෙනස් ආකාරයට ඉදිරිපත් කරනු ලබන හා අසම්පූර්ණ නාමයෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- යම් සාමාජිකයෙකුට අවශ්‍ය වන්නේ නම් සමිතියේ ලේකම් වෙතින් නාමයෝජනා පත්‍ර කට්ටලය ලබාගත හැකිය.
- ඡන්දාපේක්ෂක, නාමයෝජනාකරු හා ස්ථිරකරු ඡන්ද හිමි සාමාජිකයෙකු විය යුතු වේ.
- අපේක්ෂකයන් සමිතියේ අතුරු ව්‍යවස්ථාවේ 38(1) වගන්තියේ ඇතුළත් නුසුදුසුකම් වලින් නොපෙළෙන අයවලුන් විය යුතුය.
- නාම යෝජනාවක් සම්බන්ධව විරෝධතාවයන් ඉදිරිපත් කරන්නේ නම් එය ලිඛිතව ඉදිරිපත් කල යුතුය.

ඉහත සඳහන් තනතුරු සඳහා නියමිත ප්‍රමාණයට වඩා සුදුසුකම්ලත් නාමයෝජනා ඉදිරිපත් වුවහොත් අදාල තනතුරු සඳහා සුදුස්සන් තෝරා පත් කර ගැනීමේ නිලවරණය,

2026.03.28 වන දින පෙ.ව.9.30 සිට ප.ව.4.00 දක්වා කාලය තුල මහනුවර, පොල්ගොල්ල, ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ මහින්ද රාජපක්ෂ ශ්‍රවණාගාරය ඇතුළු වම පරිශ්‍රයේදී පැවැත්වෙන බව ද මෙයින් දැනුම් දෙමි.

නිලවරණය පැවැත්වීමට සිදුවුවහොත් ඡන්ද හිමි සාමාජිකයන්ට තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත සහ සාමාජිකත්වය තහවුරු කිරීම සඳහා සාමාජික පාස්පොත හෝ පිළිගත් තහවුරු ලේඛනයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

**ලේකම්**
**සීමාසහිත සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතිය.**
**37/36, පන්සල පාර, කොළඹ 10**
**2026.02.19 දින දිය**

*(සෑම තනතුරක් සඳහාම වෙන වෙනම නාමයෝජනා පත්‍ර කට්ටල දෙක බැගින් ඉදිරිපත් කල යුතුය.)*

---

**සීමාසහිත සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතිය**
සභාපති, උප සභාපති, භාණ්ඩාගාරික සහ කාරක සභික (අධ්‍යක්ෂ) ධුර සඳහා නාමයෝජනා පත්‍රය

1. **සමිතියේ නම හා ලිපිනය:** සීමාසහිත සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතිය. 37/36, පන්සල පාර, කොළඹ 10.
2. **නාමයෝජනා ඉදිරිපත් කරන තනතුර :** ..........................................................
3. **අපේක්ෂකගේ, යෝජනාකරුගේ හා ස්ථිරකරුගේ විස්තරය :**

| විස්තරය | අපේක්ෂක | යෝජනාකරු | ස්ථිරකරු |
|---|---|---|---|
| සාමාජික නාමලේඛනය අනුව සම්පූර්ණ නම | | | |
| සාමාජික අංකය | | | |
| ජාතික හැඳුනුම්පත් අංකය | | | |
| රාජකාරි ලිපිනය | | | |
| පෞද්ගලික ලිපිනය | | | |

4. අපේක්ෂකගේ ප්‍රකාශය, යෝජනාකරුගේ ප්‍රකාශය සහ ස්ථිරකරුගේ ප්‍රකාශය පහතින් දක්වා ඇති අතර ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමු.

අපේක්ෂකගේ අත්සන .............................. දිනය ..............................

යෝජනාකරුගේ අත්සන .............................. දිනය ..............................

ස්ථිරකරුගේ අත්සන .............................. දිනය ..............................

---

## අපේක්ෂකගේ, යෝජනාකරුගේ හා ස්ථිරකරුගේ ප්‍රකාශයන්

**අපේක්ෂකගේ ප්‍රකාශය**

.................................................. වන මම, සීමාසහිත සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතියේ අංක ............. යටතේ සාමාජිකත්වය ලබා ඇති අතර .............................. (අපේක්ෂිත තනතුර) වශයෙන් මාගේ නම යෝජනා කිරීමට මෙයින් කැමැත්ත දෙමි. සමිතියේ කාරක සභාවට (අධ්‍යක්ෂ මණ්ඩලයට) තේරීපත්වීම සඳහා සමිතියේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් වන නුසුදුසුකම් කිසිවකින් මා නුසුදුසු නොවන බව ප්‍රකාශ කරමි. නාමයෝජනා පත්‍රයෙහි මා විසින් අත්සන් තබා සහතික කරන ලද කරුණු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

අපේක්ෂකගේ අත්සන .............................. දිනය : ..............................

**යෝජනාකරුගේ ප්‍රකාශය**

.................................................. වන මම, ඉහත නම සඳහන් සමිතියේ අංක ............. යටතේ සාමාජිකත්වය ලබා ඇති බව සහතික කරන අතර, නාමයෝජනා පත්‍රයෙහි මා විසින් අත්සන් තබා සහතික කරන ලද කරුණු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි.

යෝජනාකරුගේ අත්සන .............................. දිනය : ..............................

**ස්ථිරකරුගේ ප්‍රකාශය**

.................................................. වන මම, ඉහත නම සඳහන් සමිතියේ අංක ............. යටතේ සාමාජිකත්වය ලබා ඇති බව සහතික කරන අතර, නාමයෝජනා පත්‍රයෙහි මා විසින් අත්සන් තබා සහතික කරන ලද කරුණු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි.

ස්ථිරකරුගේ අත්සන : .............................. දිනය : ..............................